මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PMM/Eval/2024
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.01.12

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛ අංක: 01/2024

සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළු පළාත්සභාවල ප්‍රධාන ලේකම්වරුන්
විශේෂ වියදම් ඒකක ප්‍රධානීන්
සියළු දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්
සියළු දිස්ත්‍රික් ලේකම්වරුන්

**ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා**
**සියළු රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්යභාරය**

1. දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ බහුවිධ සංවර්ධනය අරමුණු කරගනිමින් සිදුකරන ලද ප්‍රතිපත්ති හා ආයෝජනවලින් අපේක්ෂිත අභිමතාර්ථ ලබා කර ගැනීම වර්තමානයේ දැඩි ලෙස සාකච්ඡාවට බඳුන් වූ කරුණකි. එබැවින්, මෙතෙක් ක්‍රියාත්මක වූ මෙන්ම දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන්වල සාර්ථක හෝ අසාර්ථකභාවය අනාවරණය කර ගැනීම සඳහා විශ්වාසනීය මෙන්ම විද්‍යාත්මකව තහවුරු කරන ලද තොරතුරු සමාලෝචනය කිරීමට සුදුසුම හා කාලෝචිත ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සඳහා 2018 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද **ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය** ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

2. ඒ අනුව, වර්තමානයෙහි ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ආර්ථික අර්බුදයට තිරසාර පිළියම් ලෙස ඉහළ ශක්‍යතාවයක් සහිත ප්‍රතිපත්ති හා සංවර්ධන ආයෝජන තෝරාගැනීමේදී හා ආර්ථික ක්‍රමසම්පාදනයේදී ඇගයීම් වලින් උගත් පාඩම් හා අනාවරණයන් භාවිතය අනිවාර්ය විය යුතු අතර, එමගින් විනිවිදභාවය හා වගවීම තහවුරු වන බැවින් කාලීනව අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීමට හැකි වනු ඇත.

3. ඇගයීම් ප්‍රතිපත්තිය සාර්ථකව රාජ්‍ය යාන්ත්‍රණය තුළ ආයතනගත කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ග හා තාක්ෂණික මාර්ගෝපදේශ ඇතුලත් *ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව* ද 2023 වර්ෂයේදී හඳුන්වා දී ඇති අතර, එදින සිට සියළුම රාජ්‍ය ආයතන ස්ථරයන් ආවරණය වන පරිදි මේ සම්බන්ධයෙන් වන දැනුම්වත් කිරීම් හා පුහුණු කටයුතුද අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. එමගින් ඇගයීම රටෙහි සියළු ක්ෂේත්‍රයන් අතර පොදු භාවිතාවක් බවට පත්වීම මෙන්ම ක්‍රමානුකූලව ඇගයීම් සංස්කෘතියක් ඇතිකිරීම ද අපේක්ෂා කෙරේ.

4. රාජ්‍ය අංශයේ සියළු ආයතන විසින් *ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ* රාමුවට අනුගතව 2024 වර්ෂයේ සිට සංවර්ධන ඇගයීම් සිදුකල යුතුය. පහත සඳහන් වෙබ් සබැඳිය භාවිතා කර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව බාගත කරගත හැකිය. (වෙබ් සබැඳිය: https://www.treasury.gov.lk/web/national-evaluation-policy-implementation-framework-2023). සංවර්ධන ඇගයීම් සම්බන්ධ සියළුම තාක්ෂණික සහාය සඳහා මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත යුතුය.

5. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු නව ආයතනයක් ස්ථාපනය කිරීම හෝ වැටුප්, දීමනා සහිත නව තනතුරු ඇති කිරීම සිදු නොකෙරේ. කෙසේ වුවද, අංක 23/2283/604/223 හා 2023.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2024 වසරේ සිට රාජ්‍ය ආයතනවල කාර්යභාරයෙහි අංගයක් ලෙස සංවර්ධන ඇගයීම් සංකල්පය ඇතුලත් කිරීමට කටයුතු කිරීම සියළුම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 9 වන කොටසේ විධිවිධානයන් සංවර්ධන ඇගයීම් ක්‍රියාවලියටද අනුකූල වන බැවින්, ඒ සඳහා අවශ්‍ය වන විශ්වාසනීය, ගුණාත්මක හා යාවත්කාලීන වූ සංවර්ධන දත්ත හා තොරතුරු ගබඩාවක් පවත්වා ගැනීමට අදාලව ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ.

6. සෑම වසරකම ජනවාරි මස අවසන්වීමට ප්‍රථම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ඇගයීම් යෝජනා කැඳවනු ලබන අතර වාර්ෂික ඇගයීම් න්‍යායපත්‍රය අනුව එළඹෙන වසරෙහි යෝජිත ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන අනුමත කිරීම පිළිබඳ තීරණ ගැනෙනු ඇති බැවින්, ඒ අනුව ඇගයීම් ක්‍රියාවලියට පූර්ව සූදානමක් පවතින බව සහතික වීම සෑම රාජ්‍ය ආයතනයකම වගකීම වේ.

7. අභියෝගාත්මක සමාජ ආර්ථික තත්වයකට රට මුහුණ පා ඇති මේ මොහොතේ, අමාත්‍යාංශ ඇතුළු විවිධ රාජ්‍ය ආයතන යටතේ ආරම්භ කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් සාර්ථකව මෙන්ම අනුමත කාලරාමුව තුල නිමකිරීම මගින් පුරවැසියන්ගේ ජීවන තත්වය වඩාත් යහපත් මට්ටමක් දක්වා කඩිනමින් නගාසිටුවීම සුවිශේෂී අවශ්‍යතාවයකි. එබැවින්, ඇගයීම සඳහා සංවර්ධන මැදිහත්වීම් තෝරාගැනීමේදී ජන ජීවිතයට ඉහළ බලපෑමක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබාදීමට පියවර ගත යුතුය. තවද, ඇගයීම් සංකල්පය රාජ්‍ය යාන්ත්‍රණය තුළ ආයතනගත වීම තහවුරු වන තෙක්, ඉදිරි වසර 03 තුළ සියළුම සංවර්ධන ඇගයීම් කටයුතු අදාල රේඛීය අමාත්‍යාංශය හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව, පවතින මූල්‍ය දුෂ්කරතා කළමනාකරණය කර ගනිමින් සිදු කරනු ඇත.

8. මහා පරිමාණ ව්‍යාපෘතිවල කාලය 50% ක් ඉක්මවා ඇතත්, ඒවායේ ක්‍රියාකාරකම්වල තත්‍ය ප්‍රගතිය 25% ක් වත් නොමැති අවස්ථාවලදී එම ව්‍යාපෘතිවල ඉදිරිය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා මැදිකාලීන ඇගයීමක් සිදු කෙරෙනු ඇත.

9. සංවර්ධන ඇගයීම් තෝරා ගැනීම, දැනටමත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇති "ජාතික ඇගයුම් මෙහෙයුම් කමිටුව" මගින් සිදුකිරීමෙන් අනතුරුව, ඇගයීම්වල අනාවරණයන් හා ඒ මත පදනම්ව ලබාදෙන නිර්දේශ එම කමිටුවෙහි නිරීක්ෂණ ද සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත සුදුසු ඇගයීම් අනාවරණයන් හා නිර්දේශ පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙනු ඇත.

10. පවත්නා අර්බුදකාරී ආර්ථික තත්වය තුල ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන වෙන් කිරීමේදී මහා භාණ්ඩාගාරය මුහුණපාන පීඩනය හේතුවෙන්, යෝජිත ඇගයීම් සියල්ලම සඳහා ජාතික අයවැයෙන් මූල්‍ය ප්‍රතිපාදන සැලසීම අපහසු බැවින්, හැකි සෑමවිටම ඒ සඳහා සුදුසු විකල්ප මූල්‍ය ප්‍රභව හඳුනා ගත යුතුය. එලෙස

හඳුනාගන්නා ලද විකල්ප මූලා ප්‍රභවයන්හි යෝග්‍යතාව හා විශ්වාසනීයත්වය විධිමත්ව තහවුරු කර ගැනීම සඳහා නිසි ක්‍රමවේද අනගමනය කරමින් මහා භාණ්ඩාගාරයේ අදාල දෙපාර්තමේන්තුවල සහාය ලබාගත යුතුය. එමෙන්ම, ඇගයීම පිළිබඳ අත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමට හා මූලා දායකත්වය මෙන්ම තාක්ෂණික සහාය ප්‍රශස්ත මට්ටමින් ලබා දීමට හැකි සුදුසු පාර්ශවකරුවන් සමග එකාබද්ධ ඇගයීම් (joint evaluations) වැඩි වශයෙන් සැලසුම් කිරීම සඳහා ද අවධානය යොමුකල යුතුය.

11. ඇගයීම් සංස්කෘතිය රටතුල ස්ථාපනය කිරීමේ අරමුණ පෙරදැරිව, ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව ක්‍රියාවට නැංවීම හරහා රාජ්‍ය ආයෝජන මගින් අපේක්ෂිත ප්‍රතිඵල උත්පාදනය කිරීමත්, එම ක්‍රියාවලිය තුලදී රාජ්‍ය අංශයේ වගවීම තහවුරු කිරීමත් අපේක්ෂා කෙරේ. එබැවින්, ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව මගින් අනුමත කරන ලද ඇගයීම් යෝජනා ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන සියළු රාජ්‍ය ආයතනයන්හි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන ක්ෂේත්‍රයක් වශයෙන් ඇගයීම හඳුනාගත යුතුය.

12. ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකකිරීමේ රාමුව පරිහරණය කිරීමේදී මතුවන යම් අපැහැදිලි බවක් හෝ ගැටළු සහගත තත්වයක් නිරවුල් කරගැනීම සඳහා යම් තාක්ෂණික සහායක් අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් ඊ-තැපැල හෝ දුරකථනය හරහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසිය යුතුය.

විද්‍යුත් තැපැල- dgpmm@pmmd.treasury.gov.lk, දුරකථනය - 011-2151444

**කේ.එම්. මහින්ද සිරිවර්ධන**
ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. පාර්ලිමේන්තුවේ මහලේකම්